REFERENCE ONLY
2016-07-18

# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2016
# සිංහල භාෂාව හා සාහිත්‍යය

විභාග අංකයඃ ..........................................................

| 10 ශ්‍රේණිය | I පත්‍රය | කාලය පැය 01 |
|---|---|---|

**උපදෙස්**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 40 කි.
- අංක 1 සිට 40 තෙක් ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- අංක 01 සිට 03 තෙක් වාක්‍යයන්හි තදකළ අකුරින් මුද්‍රිත කොටසට වඩාත් සමීප අදහස ඇති වරණය තෝරන්න.

01. ඡන්ද ප්‍රතිඵල නිකුත් වෙද්දී ඇතැම් අපේක්ෂකයෝ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ රැඳී නොසිට **ලිස්සා ගියහ.**

(1) ලිස්සන සුලු මගක යෑම. (2) නොදන්වා පිට වී යාම.
(3) හෙමින් සීරුවේ ඉවත්ව යෑම. (4) කිහිප දෙනෙකුට නොදන්වා යෑම.

02. "බලපං ගුණේ, මගෙ ඔළුවෙ **අං ඇවිල්ලද කියල**" ධර්මේ පැවසී ය.

(1) මෝඩ වැඩක් කිරීම. (2) අතපසු වීමක් සිදුවීම.
(3) අං ඇවිල්ලා. යන සිතුවිල්ල (4) බුද්ධිමත් ක්‍රියාවක නිරත වීම.

03. පුරාවිද්‍යා ගවේෂකයාගේ දේශනයේ කරුණු **පුස්ස බින්දාක්** වැනි ය.

(1) ඓතිහාසිකව වැදගත් වූවකි. (2) සංවර්ධනාත්මක වූවකි.
(3) නිෂ්ඵල වූවකි. (4) ඉතා සාරවත් වූවකි.

- පහත සඳහන් වාක්‍යයන් හි හිස්තැන් සඳහා වඩාත් සුදුසු පදය තෝරන්න.

04. "වෙසතුරු දා කව" සඳහා ............................ වූයේ පන්සිය පනස් ජාතක පොත සහ බුත්සරණ යි.

(1) පරිශ්‍රය (2) පරිවර්තනය
(3) ආශ්‍රමය (4) මූලාශ්‍රය

05. නැකැත් ශාස්ත්‍රය අනුව සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට ............................ වීම, නව අවුරුදු උදාව ලෙස සැලකේ.

(1) සංක්‍රමණය (2) ග්‍රහණය
(3) ආක්‍රමණය (4) සංචරණය

06. පරිසරයට ............................ වීමෙන් ඇතැම් සත්තු සතුරන්ගෙන් ආරක්ෂා වෙති.

(1) අනුගමනය (2) අනුවර්තනය
(3) ආකර්ෂණය (4) සම්මිශ්‍රණය

07. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඇති වූ පරිගණක විප්ලවයත් සමඟ එකියා වෙළෙඳපොළේ .............................. වෙනස් වී ඇත.

(1) ප්‍රබලතා (2) විශේෂතා

(3) දුර්වලතා (4) ප්‍රමුඛතා

08. තම ආගමට අවංක වීමෙන් තමා තුළ මනා .............................. ඇති වෙයි.

(1) තීක්ෂ්ණයක් (2) ශික්ෂණයක්

(3) තාක්ෂණයක් (4) භක්තියක්

09. "සර්ෂ" පමණක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ය, ර, ල, ව (2) ක, ච, ට, ත, ප

(3) ශ, ෂ, ස, හ (4) ප, ඵ, බ; භ

10. අකාරාදී පිළිවෙළට නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) අලියා, ඔටුවා, පැස්බරා, වඳුරා (2) බැටළුවා, ගවයා, නරියා, එළුවා

(3) මුවා, හාවා, ගෝනා, සිංහයා (4) බල්ලා, මුවා, වලහා, නරියා

11. අක්ෂර වින්‍යාසය නිවැරදි පද පේළිය තෝරන්න.

(1) වර්දනය, මර්දනය, ශ්‍රේෂ්ඨ, ජ්‍යෂ්ඨ

(2) පුස්තකාලය, සම්ප්‍රදාය, නිර්දිෂ්ඨ, පරිවර්ථනය

(3) ශිෂ්ඨාචාරය, කාර්යාලය, අභිලාෂය, කනගාටුව

(4) විශිෂ්ට, ලේඛනය, පලතුරු, නටබුන්

12. 'කරති' යන වර්තමානකාල, කර්තෘකාරක, බහුවචන ආඛ්‍යාතයෙහි, අතීතකාල, කර්මකාරක, බහුවචන, ආඛ්‍යාතය වනුයේ,

(1) කරනු ලැබූහ. (2) කරන ලදී.

(3) කෙරිණි. (4) කළහ.

13. "විත්තියෙනුත් පැමිණිල්ලෙනුත් ඉදිරිපත් කළ කාරණාවලට මෙම අධිකරණය බොහොම ප්‍රවේසමෙන් කන්දුන්නා"

ඉහත ප්‍රකාශයෙහි ඇතුළත් නොවනුයේ,

(1) ක්‍රියා පදයි. (2) විශේෂණ පදයි.

(3) යුගල පදයි. (4) නිපාත පදයි.

14. අනුක්ත පද පමණක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) දැරියක, මිතුරෙකු, අපි, අශ්වයින් (2) මා, මිනිසුන්, නරියෙකු, කාන්තාවක

(3) ගසක්, හාවෙකු, වඩුවෙක්, වඳුරන් (4) මිනිස්සු, මිනිසෙක්, මිනිසුන්, මිනිසෙකු

15. 'වැඩිහිටියෝ' යන පදයේ ප්‍රකෘතිය වනුයේ,

(1) වැඩිහිටියන් (2) වැඩිහිටියෙකු

(3) වැඩිහිටි (4) වැඩි

- මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

16. (1) තද්ධිත පද - නාගරික, දක්ෂතා, අයහපත්, බුද්ධිමත්

(2) සන්ධි පද - නැණැති, අතිනත, ලිග්ගල, ගුරුතුමා

(3) යුගල පද - ඇතිනැති, උඩයට, වගතුග, යානවාහන

(4) උපසර්ග පද - අවංක, සංවර්ධනය, ප්‍රයෝජන, අනුමාන

2016.07.18 සිංහල 10 ශ්‍රේණිය

REFERENCE ONLY

17. මධ්‍යම පුරුෂ බහුවචන පද පමණක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) තා, නුඹ (2) තොපි, අපි

(3) ඔවුහු, නුඹලා (4) තොපි, නුඹලා

- පහත ප්‍රකාශයට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

18. "එකට එක්ව සිට බාධා, කරදර පමුණුවයි"

(1) ජාඩියට මූඩිය වගේ (2) අගේ ඉඳං කන කනවා වගේ

(3) කිරි කළයට ගොම දම්මා වගේ (4) බොරදියේ මසුන් බෑම වගේ

19. "මැටි ගොඩ <u>අනා</u> සකපෝරුවෙ තියන්නේ" මෙහි ඉරි ඇඳි පදය අයත් වනුයේ,

(1) පූර්ව ක්‍රියා (2) මිශ්‍ර ක්‍රියා

(3) ප්‍රයෝජ්‍ය ක්‍රියා (4) විධි ක්‍රියා

20. ගුරුතුමිය වාපයක් **අඳිද්දී** අපි ප්‍රශ්න **අසමින්** සිටිමු.

මෙහි අංකිත පද දෙක පිළිවෙළින් අයත් වනුයේ,

(1) විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා (2) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(3) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා (4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

21. A - යුගල පද ගොඩනැගෙන ක්‍රම කිහිපයක් වෙයි.

B - උපසර්ග පද තනිව අරුත් ගැන්වෙයි.

C - වාක්‍යයක ද්විත්ව උක්තය යෙදෙන විට ආඛ්‍යාතය බහු වචනයි.

D - කර්මකාරක වාක්‍යයක "විසින්" නිපාතය යෙදෙයි.

ඉහත අවස්ථා සම්බන්ධයෙන් නිවැරදි පෙළ ගැස්ම වනුයේ,

(1) B D ය. (2) A C ය.

(3) A D ය. (4) A B ය.

22. A - තද්ධිත පද B - කෘදන්ත පද

C - ගෞරවාර්ථ පද D - විශේෂණ පද

මෙහි A හා B - ප්‍රත්‍යයාර්ථ නාම වේ.

මෙහි A හා D - අව්‍යය පද වේ.

මෙහි B හා C - ශුද්ධ ආඛ්‍යාත පද වේ.

මෙහි C හා D - විශේෂ්‍ය පද වේ.

මෙහි නිවැරදි ප්‍රකාශ කාණ්ඩය වනුයේ,

(1) A හා D ය. (2) A හා B ය.

(3) B හා C ය. (4) C හා D ය.

- පහත දක්වෙන ප්‍රකාශවලට නොගැළපෙන ඡත්‍ර පදය තෝරන්න.

23. (1) ජනයා බහුලව වාසය කරන - ජනාකීර්ණ (2) රාත්‍රියෙහි හැසිරෙන - නිශාචර

(3) කොණ්ඩය, රැවුල කපන්නා - කරණවෑමි (4) කිසිවෙකුටත් දෙවෙනි නොවන - ද්විතීය

- මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන වචනයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

24. (1) ජලය - උදක, රවි, දිය (2) ගෘහය - ගෙය, නිවාසය, සරය
(3) කන්ද - ගිර, පව්ව, පර්වතය (4) ස්තූපය - චෛත්‍යය, දාගැබ, සෑය

25. "ශ්වේත ඡත්‍රය" නම් වචනයේ තත්භවය වනුයේ,
(1) සුදු හැරමිටියයි. (2) ජය කොඩියයි.
(3) සුදු කුඩයයි. (4) වර්ණ සේසතයි.

26. "පොළොවට වැටෙන හැම වැහි බිඳුවකම පහේ
ගැබ්වුණ සිසිල එයි ඊතල පරිදි මෙහේ"

ඉහත පද්‍ය කොටසේ ඇතුළත් උපමේය හා උපමාව පිළිවෙළින් සඳහන් වනුයේ,

(1) සිසිල - ඊතල (2) ඊතල - සිසිල
(3) වැහිබිඳු - සිසිල (4) වැහිබිඳු - ඊතල

27. "කමතේ කෙතේ - තුසිතේ ඇතේ
දෙනෙතේ සිතේ - විපතේ සෙතේ"
මෙම කොටසට අදාළව ඔබ හඳුනාගන්නා ශබ්ද රසය හඳුන්වනුයේ,
(1) තාලය වශයෙනි. (2) ව්‍යංග්‍යාර්ථය වශයෙනි.
(3) සංකේත වශයෙනි. (4) අනුප්‍රාසය වශයෙනි.

28. "කන්සෙට පාරක් දෙමැයි කියත්නි
මන් බොල තට දර <u>දිය</u> ද අදිත්නි"
මෙහි ඉරි ඇඳි පදය අයත් වනුයේ,

(1) උපසර්ග පදවලට යි. (2) බහු අර්ථ පදවලට යි.
(3) විශේෂණ පදවලට යි. (4) නිපාත පදවලට යි.

- අංක 29 සිට 31 තෙක් ඇති එක් එක් පද යුගලයෙහි දෙවන පදය (1) වැන්නට අර්ථයෙන් <u>සමාන</u> වේ ද, (2) පළමු වැන්නට අර්ථයෙන් <u>විරුද්ධ</u> වේ ද, (3) පළමු වැන්නෙහි අර්ථය <u>වැඩි</u> කරයි ද, (4) පළමුවැන්නට <u>වෙනස්</u> අර්ථ සහිත වේ ද යන්න තෝරන්න.

29. කුදහන්නැතුං වරෙල්ලා - පමානොවී පැමිණීම
(1) විරුද්ධ (2) වැඩි
(3) වෙනස් (4) සමාන

30. ප්‍රතිභාව - ප්‍රතිනිර්මාණය
(1) විරුද්ධ (2) සමාන
(3) වෙනස් (4) වැඩි

31. හර්ෂය - ප්‍රහර්ෂය
(1) වැඩි (2) විරුද්ධ
(3) වෙනස් (4) සමාන

REFERENCE ONLY

- අංක 32 සිට 34 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

32. (1) මැණියන් දැ අප වෙනුවෙන් වෙහෙසෙයි. (2) නාහිමි ගිලන් වෙති.
    (3) ඇතැමෙක් ඉතා උනන්දුවෙන් ඉගෙන ගනිති.(4) එක් කෙනෙක් චිත්‍රයක් අඳිනු ලබයි.

33. (1) ක්‍රිකට් ක්‍රීඩකයෝ පිටිය ට පැමිණෙද්දී පිරිස අත්පොළසන් දුන්හ.
    (2) උපදේශකවරුන් විසින් සියලු ප්‍රශ්න පත්‍ර සකස් කරන ලදී.
    (3) මලින් සැරසුණු වෘක්ෂයෝ අප නෙත් පිනවයි.
    (4) නිලධාරීහු රැස්වීමට නියමිත වේලාව ට පැමිණෙති'යි පාලකයෝ සිතුහ.

34. (1) ලේකම් හෙවත් වෘත්තීය සමිති නායකයා මෙදින රැස්වීමට පැමිණෙති.
    (2) කමල් ද, නිමල් ද, වැවේ ඔරු පැදීම ට ගියේ ය.
    (3) මා මිතුරන් සමඟ ක්‍රීඩාගාරය ට පිවිසියෙමි.
    (4) මෙදින උසස් පෙළ සිසුහු පංතියේ නැත.

- 35,36 ප්‍රශ්නවල මුලින් සඳහන් පාඨයට වඩාත් සමීප අදහස දෙන යෙදුම තෝරන්න.

35. "උඹලා මගේ දරුවෝ කිව්වලු සාර්තුමා. මිනිසුන්ට කියලා උන්ගේ හිස ගසා දමමලු"
    (1) සාර්තුමා මිනිසුන් මරා දැමීමට උපදෙස් දුන් බව
    (2) සාර්තුමා දරුවන්ගේ හිස ගසා දැමීමට මිනිසුන්ට කියූ බව.
    (3) සාර්තුමාගේ දරු දුක නිසා, මිනිසුන්ගේ හිස ගසා දැමූ බව
    (4) සාර්තුමා විසින් මිනිසුන්ගේ හිස ගසා දැමූ බව

36. "පරිසර දූෂණය අවම කළ හැකි වෙනත් බල ශක්තීන් පිළිබඳ සොයා බැලීමේ දී, හිරු එළිය සහ සුළං පරිසරයට කිසිදු හානියක් නොවන අයුරින් භාවිතයට ගත හැකි බව පෙනේ."
    (1) පරිසර දූෂණය අවම කළ හැකි වෙනත් බල ශක්තියක් ලෙස හිරු එළිය යොදාගත හැකියි.
    (2) පරිසර දූෂණය අවම කළ හැකි වෙනත් බල ශක්තියක් ලෙස සුළං යොදාගත හැකියි.
    (3) පරිසර දූෂණය අවම කෙරෙන වෙනත් බල ශක්තීන් නම්, හිරුඑළිය සහ සුළං ය.
    (4) හිරුඑළිය සහ සුළං කිසිවෙකුටත් හානියක් නොවන අයුරින් භාවිතයට ගත හැකියි.

- ප්‍රශ්න අංක 37 සිට 38 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් ඡේදය කියවා පිළිතුරු සපයන්න.

අප අවට පරිසරයෙහි ඇති අනන්ත අප්‍රමාණ වූ ව්‍යාධිජනකයින්ගෙන් ආරක්ෂා වී සිටීම පිණිස වැදගත්වන ආරක්ෂක වළලු කිහිපයක් පවතියි. මෙයින් පළමුවැන්න වන්නේ 'මිනිස් සමයි' කෙරටිනීභූත වූ මියගිය සෛල ස්ථරයක්, ස්වේද ග්‍රන්ථි, තෙල් ග්‍රන්ථි සහ රෝම කූපවලින් සමන්විත සම මගින් භෞතික මෙන් ම. රසායනික ලෙස ව්‍යාධිජනකයින් සිරුර තුළට ඇතුළුවීමටත්, සම මත තහවුරු වීමත් වළක්වා ඇති එහි ශ්ලේෂ්මලයේ ක්‍රියාකාරීත්වය ඉතා ප්‍රබල ය.

කිසියම් ලෙසකින් ක්ෂුද්‍ර ජීවීන් දේහයේ පිටතින් ඇති බාධක විනිවිද රුධිර සංසරණ පද්ධතිය ට පටකයක ට හෝ වසා පද්ධතිය ට ඇතුළු වූ විට ඒවායේ අඩංගු විවිධ සෛල මගින් මෙම භක්ෂක සෛලතාව ඇති කරයි. මෙහිදී රුධිරයේ සහ සමහර පටකවල අඩංගු විශේෂිත සෛල මගින් දේහයට ඇතුළුවන බැක්ටීරියා සහ අනෙකුත් ක්ෂුද්‍ර ජීවීන් ආගන්තුක ද්‍රව්‍ය අධිග්‍රහණය කොට අන්තඃ සෛලීය ලෙස ජීරණයට ලක්කර විනාශකර දමයි.

37. මෙම ඡේදයෙන් ප්‍රකාශිත ප්‍රධාන ආරක්ෂක වළල්ල කුමක්ද?
    (1) රෝම කූපයි. (2) තෙල් ග්‍රන්ථියි.
    (3) වසා ග්‍රන්ථියි. (4) මිනිස් සමයි.

38. පරිසර පවිත්‍රතාව පිළිබඳ සෑම විටම අවධානයෙන් කටයුතු කළ යුතු බව මෙහිදී අවධාරණය වන්නේ කෙසේ ද?

(1) පරිසරය ආරක්ෂාකාරී වීම නිසා ය.

(2) පරිසරය ව්‍යාධිජනකයින්ගෙන් බහුල නිසයි.

(3) ආරක්ෂක වළලු කීපයක් පවතින නිසයි.

(4) රුධිර සෛල මගින් විෂ බීජ ජීරණය කරන නිසයි.

★ 1) "වරෙල්ලා, ආයෙත් තල්ලු කරමු"

2) "මට මොකුත් පේන්නේ නෑ! මට දිපල්ල රෙදි කෑල්ලක්"

3) මේ මිනිස්සු තමයි මහ පොළොවෙ නියම පුත්තු"

● ඉහත ප්‍රකාශ ඇතුළත් පාඩම්වල අනුපිළිවෙළ වනුයේ,

39. (1) හුණුවටයේ කථාව / තොරොක්කෝව / මං තනන්නෝ

(2) මං තනන්නෝ / තොරොක්කෝව / හුණුවටයේ කථාව

(3) තොරොක්කෝව / හුණුවටයේ කථාව / මං තනන්නෝ

(4) හුණුවටයේ කථාව / මං තනන්නෝ / තොරොක්කෝව

● ඉහත ප්‍රකාශවල අනුපිළිවෙළ කවුරුන් විසින් කරන ලද්දේ ද?

40. (1) මහේන්ද්‍ර විසින් / අසඩක් විසින් / ර්යෝහෙයි විසින්

(2) ර්යෝහෙයි විසින් / අසඩක් විසින් / මහේන්ද්‍ර විසින්

(3) අසඩක් විසින් / මහේන්ද්‍ර විසින් / ර්යෝහෙයි විසින්

(4) ර්යෝහෙයි විසින් / මහේන්ද්‍ර විසින් / අසඩක් විසින්

18 . 07 . 2016

# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2016
# සිංහල භාෂාව හා සාහිත්‍යය

විභාග අංකය: ..........................................................

| 10 ශ්‍රේණිය | II පත්‍රය | කාලය පැය 2 |
|---|---|---|

**උපදෙස්**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ප්‍රමාණය 80 කි.

01. අංක i සිට x දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්

(අ) අඝෝෂ අක්ෂරයක් ලියන්න. (ආ) අර්ධ ස්වරයක් ලියන්න.

ii. පහත සඳහන් ප්‍රස්තාව පිරුළුවලින් ප්‍රකාශිත අදහස ලියන්න.

(අ) කබලෙන් ලිපට වැටුණා වගේ (ආ) දිය කාවගෙ පිටේ ලුණු හැංගුවා වගේ

iii. පහත යුගල පදවලට ගැළපෙන ලෙස යොදන යුගල පද දෙකක් ලියන්න.

(අ) යනඑන = (ආ) කෙළිසෙල්ලම් =

iv. පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය, කර්ම කාරකයටද, කර්ම කාරක වාක්‍යය කර්තෘ කාරකයට ද හරවා ලියන්න.

(අ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති.

(ආ) කම්කරුවන් විසින් වැඩවර්ජනය ආරම්භ කරන ලදී.

v. තද්ධිත පද ලියන්න.

(අ) ධනය ඇති - (ආ) රූපය ඇති -

vi. ඉරි ඇඳි පදවල ව්‍යාකරණ විධි දක්වන්න.

(අ) අශෝක රජතුමා දැහැමි පාලකයෙක් <u>ද</u>? (ආ) <u>පාලකයන්</u> අවංක නොවන්නේ ඇයි?

කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

vii. එක මග යන කල **ඔබිනට** ඇද්දෝ

**ආනන** කල උගෙ කට ගඳ නැද්දෝ

(අ) ඔබින - (ආ) ආනන -

viii. පහත සඳහන් වචන තත්භව (සිංහල බස) ලෙස ලියන්න.

(අ) මිත්‍ර ධර්මය - (ආ) මනුෂ්‍ය අක්ෂිය -

ix. රූ - ලා යන අක්ෂර දෙකේ යෙදී ඇති පිල්ලම්වල පිල්ලම් නාමය ලියන්න.

(අ) රූ - (ආ) ලා -

x. පහත සඳහන් මොනරාගල ප්‍රාදේශීය ව්‍යවහාරවලට අර්ථ දක්වන්න.

(1) කොකිස් - (2) ඔයනවා -

(ලකුණු 2 x 10 = 20)

02. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා උචිත මාතෘකාවක් යොදන්න.

(අ) ඉතාම අලංකාර පරිසරය පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය නිසා අද විනාශය ට පත් වී අවසන් වන තත්ත්වය ට පැමිණ ඇත. ඇතැමෙක් මේවා පුළුස්සා දමති. එයින්ද පරිසර දූෂණය වන බව බොහෝ අය නොසිතති. මෙසේ පරිසරය විනාශවන ආකාර බොහෝමයක් පවතියි. මෙම අවස්ථාවන් වළකා, පරිසර දූෂණයට එරෙහි වෙමු.

(ආ) ශ්‍රී ලංකාව ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් හිමි රටකි. මහින්දාගමනයත් සමගම විවිධ වූ කලා නිර්මාණ මෙරට ආරම්භ විය. අනුරාධපුරය, පොළොන්නරුව, සීගිරිය, තිස්සමහාරාමය, මහනුවර වැනි ස්ථානවලින් හමුවන පුරාවිද්‍යාත්මක සාධක මෙරට අනන්‍යතාව පිළිබිඹු කරයි. මෙරටට ධනය උත්පාදනය කිරීමට ද, මෙම ස්ථානවල අගය හේතුභූත වී ඇත. අපේ ශ්‍රේෂ්ඨ පුරාවස්තු රැක ගැනීම අපේ යුතුකමයි.

(ඉ) "තාක්ෂණය" යන්න අද වඩාත් ම ලෝකය කථාකරන මාතෘකාවකි. පරිගණකය, ජංගම දුරකථනය හා වෙනත් සන්නිවේදන මාධ්‍යයන්, වර්තමාන ලොව ම විශ්ව ගම්මානයක් කර ඇත. නූතන තාක්ෂණය භාවිතයේ දී එහි ගුණාගුණ හඳුනාගැනීම පුද්ගල සංවර්ධනය කෙරෙහි ප්‍රබලව ම බලපා ඇත.

(ඊ) සෑම මහ වැස්සකට ම පිටාර ගලන ඇළ මෙවර රිදී නූලක් වගේ ගලා බසියි. පිටාර ගලන ඇළට උඩින් නව පාලමක් 'සහන්ලාගේ' ගමට ලැබී තිබේ. මෙදින නව පාලම විවෘත කිරීමට මුළු ගම ම සූදානමින් සිටින ආකාරය නිර්මාණාත්මක ප්‍රබන්ධයක් ලෙස ගොඩ නගන්න.

(ලකුණු 25 යි.)

03. පහත දැක්වෙන ඡේදය වචන 50 - 60 අතර ගණනකින් යුක්තවන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ඕනෑම රටක ඉතිහාසය ගොඩනැංවීම ට ආධාර වන ජීවමය සාධක වන්නේ එකී සමාජය සතු පුරාවස්තු ය. එකී ජනතාවගේ ප්‍රෞඪත්වය රැඳී පවතින්නේ ඔවුන්ගේ මුතුන් මිත්තන් විසින් ගොඩනංවන ලද අතීතය මතයි. ශ්‍රී ලාංකික අපට එවැනි දීර්ඝ වූත් අනාදිමත් වූත්, සුන්දර වූත්, අතීතයක් ඇත. ඒ බවට සාක්ෂි, මෙම සුන්දර පෞරාණික බිම සපයයි. පැරැන්නන් විසින් නිෂ්පාදනය කරන ලද, ඔවුන් භාවිත කරන ලද සියලු ම දේ පුරාවස්තු ලෙස පොදුවේ හැඳින්වේ. 1940 අංක 09 දරන පුරාවිද්‍යා ආඥා පනත ට හා 1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධන පනත ට අනුව 1815 මාර්තු 02 දිනට වඩා පැරණි චංචල හෝ නිශ්චල දේපල පුරාවස්තු ලෙස සැලකේ. එසේ ම මතු පරපුර උදෙසා ආරක්ෂා කළ යුතු යැයි හැඟෙන වසර 100 කට වඩා පැරණි ස්මාරක හෝ ගොඩනැගිලි පුරාවිද්‍යා ස්මාරක ලෙස නම් කෙරෙයි.

පුරාවස්තුවක එයට ම ආවේණික වූ සුවිශේෂී ගුණාංග පවතී. වර්තමානයේ අප එදිනෙදා භාවිත කරන උපකරණ ඇතුළු මෙවලම් සියල්ලක් ම පාහේ විනාශ වුවහොත්, නැවත මිලදීගත හැකියි. එහෙත් පුරාවස්තුවක් විනාශ වුවහොත් එය කිසි ලෙසකින් හෝ නැවත උත්පාදනය කළ නොහැකියි. පුරාවස්තු අතීත සමාජය ට අයත් අතීත නිෂ්පාදන වන බැවිනි. ස්වාභාවික හේතු, මිනිස් ක්‍රියාකාරකම්, කෘමීන් හා වෙනත් සතුන්ගේ බලපෑම වැනි හේතු නිසා මෙවැනි පැරණි උරුමයන් විනාශයට පත්වීම දක්න ට ලැබේ. ශ්‍රී ලංකාවේ පුරාවස්තු විනාශ කිරීම්වල ශීඝ්‍ර වර්ධනයක් මෑත කාලයේ සිට දක්න ට ලැබේ. වැඩි ප්‍රමාණයක් මානව ක්‍රියාකාරකම් ය.

(ලකුණු. 10 යි)

18-07-2016
සිංහල භාෂාව හා සාහිත්‍යය
II කොටස. 10 ශ්‍රේණිය.

04. පහත සඳහන් නිර්මාණය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ඇහැළ මලින් කළ මල් පියවිල්ලේ
පිච්ච මලක් පිපුණා වාගේ
හිරුකැන් ගොත්තේ - සිතිවිලි පිත්තේ
ඇල්මෙන් අකුරට යන මැණිකේ

පන්සල වත්තේ ඉහිරෙන තාමල්
පොත් පිටු අස්සේ පරවෙනවා
පාර දෙපැත්තේ බෝවිටියා දං
තොල් පෙති අතරේ හැංගෙනවා

අල්ලට නොසිඟා රස කැවිලි
අකුරට යන මැණිකේ
සිනිඳු දෙකන් පෙති පාළු මකාගෙන
කරපිංචා නැටි සුවඳ දූනේ

තුත් ඉරි බෙල්ලේ මාල බඳින්නට
කරල් බිඳෙනවා ඔලිඳ වැලේ
කල්ගිය රෙදි සුදු පිරුවට ඇඳගෙන
අකුරට යන මැණිකේ.................

i. ඉහත නිර්මාණය සඳහා සුදුසු මාතෘකාවක් ලියන්න.
ii. මෙහි විස්තර වන චරිතයේ දිළිඳුකම පිළිබිඹු වන අවස්ථා දෙකක් ලියන්න.
iii. මෙම නිර්මාණයෙන් අවධාරණය කෙරෙන චරිතය මුහුණ දෙන ගැටලු දෙකක් ලියන්න.
iv. "පාර දෙපැත්තේ බෝවිටියා දං - තොල් පෙති අතරේ හැංගෙනවා" යන අදහස එක් පේළියකින් පැහැදිලි කරන්න.
v. මෙම පදවල අර්ථ ලියන්න.
   1. පියවිල්ල -
   2. ඇල්ම -

(ලකුණු 10)

05. ඔබ වඩාත් සිත්ගත් සිද්ධියක් හෝ කම්පාවට පත්කළ සිදුවීමක් හෝ ඇසුරු කරගෙන පුවත්පත් විශේෂාංග ලිපියක් සකසන්න. එය නිර්මාණාත්මක ගුණයෙන් ද යුක්ත විය යුතුයි. (වචන 125 ක් පමණ සෑහේ.)

නැතහොත්

සූරියගම විජය විද්‍යාලය 2016 වසරේ දී තම පාසල ආරම්භ වී වසර සියයක් (ශත සංවත්සරය) සම්පූර්ණ වීම නිමිත්තෙන් "ශෛශව මතක සඳ" නමින් අධ්‍යාපනික ප්‍රදර්ශනයක් පැවැත්වීමට සූදානමින් සිටියි. පාසලේ ප්‍රදර්ශන කමිටු ලේකම් ඔබ යැයි සිතා, ප්‍රදර්ශනයේ අරමුණු, දිනය, වේලාව, ස්ථානය සඳහන් කරමින් එය විවෘත කර නැරඹීමට ආරාධනා කරමින්, පාසල අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා/තුමියට යවන ලිපිය සකසන්න. (වචන 125 පමණ සෑහෙයි.)

(ලකුණු 15)

REFERENCE ONLY

18.06.2016

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2016
## සිංහල භාෂාව හා සාහිත්‍යය

විභාග අංකය: ..............................................

| 10 ශ්‍රේණිය | III පත්‍රය | කාලය පැය 2 |
| --- | --- | --- |

**උපදෙස්**

- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ප්‍රමාණය 80 කි.
- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- අංක (1), (2), (3), (4) ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 10 දක්වා ඇති සියලු ම අනු කොටස්වලට පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

01. i. "රාළහාමි, ඇත්තට ම මේ ගැන මොකුත් ආරංචියක් දන්නවා ද? එයා මළයි කියලා දැනගන්ඩ ලැබුණ ද?"

(අ) මෙම අවස්ථාව උපුටාගත් කෘතිය කුමක් ද?

(ආ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවු ද?

ii. "අපගේ රජ්ජුරුවනට අස්න පමණකුත් නොලබන්නමෝ, දූන් කොප රාත් පිය නොදෙම්හ'යි......."

(අ) මෙවැනි අවස්ථාවක් සඳහන් වන්නේ කවර පාඩමක ද?

(ආ) මෙහි සඳහන් වන, 'අපගේ රජු' කවුද?

iii. ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු
බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු

ඉහත පද්‍යයේ ඉතිරි පද්‍ය පාද දෙක සම්පූර්ණ කරන්න.

iv. "නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ
රැති ලෙස රුපුනොද බිඳ ජය ගත්තෝ

(අ) ඉහත පද්‍ය පාද උපුටා ගත් කෘතිය කුමක් ද?

(ආ) මෙහි සඳහන් අවස්ථාව කුමක් ද?

v. (අ) අංක iv හි දැක්වෙන නිර්මාණ කොටස අයත් කෘතිය රචනා වූ යුගය කුමක් ද?

(ආ) එම යුගයේ රජකම් කළ රජු කවු ද?

vi. "පියසන් නොව බිඟු දූල් රැඳි කොපුලී
අවසන් නොව වෙණ නදට ම කුහුලී"

- අර්ථය ලියන්න.

(අ) පියසන් -    (ආ) බිඟුදූල් -

vii. "මේ කේවට්ට මහල්ලා ඇතුළු වූ අඥාන ජඩයෝ මා තවම මහෞෂධ පණ්ඩිත බව නොදන්නා වන්හ'යි."

(අ) මෙම අවස්ථාව ඇතුළත් ජාතක කතාව කුමක් ද?

(ආ) පන්සිය පනස් ජාතක පොතට මූලාශ්‍ර වී ඇත්තේ කුමක් ද?

viii. (අ) අංක vii න් ප්‍රකාශවන ආකාරයේ ජාතක කථා කියවීමේ රීතිය කුමක් ද?

(ආ) සිංහල ජාතක කථාවක ඇතුළත් ප්‍රධාන ආකෘතිකමය ලක්ෂණ කීය ද?

ix. පහත කළු අකුරින් මුද්‍රිත වාක්‍යාංශවලින් ගම්‍යවන අලංකාර ලියන්න.

"නිරිතදිග තද සුළඟට ඇඹර වී ඇටුවන් බැහී ගිය **ගහක් මෙන් ඇගේ ශරීරයද** නැමී ඇඹරී තිබිණ"

(අ) ......................................................................................

"ආරච්චිගේ ගෙය කැලයට යාම **කැලය ගම මැදට කඩා පැනීමකි.**"

(ආ) ......................................................................................

x. "**දිය දිය** ගොස පළ කෙරෙමින් සපැමිණි
**ගිය ගිය** තැන ඉස්වා රන්මුතු මිණි"

(අ) මෙහි කළු අකුරින් මුද්‍රිත පදවලින් ගම්‍යවන ශබ්ද රසය කුමක් ද?

(අ) මෙහි දෙවනුව යෙදෙන "දිය" යනු කුමක් ද? (ල. 2 X 10 = 20)

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. ගිරා පෝතකයෝ ඒ මන්ත්‍රණය අසා නිමවා, උන් දෙදෙනා මන්ත්‍රණය කොට අන්තයෙහි දී, **සාල්ලෙක ලා ලා පාතට බාන** කෙනෙකුන් මෙන් කේවට්ට බමුණා හිසැ **වර්චස්** පිඩක් හෙළා.....

(අ) මෙහි සඳහන් වන සිද්ධිය කෙටියෙන් ලියන්න.

(ආ) අංකිත පදවලට අර්ථ සපයන්න.

ii. ඒ දැක බෝසතාණන් වහන්සේ බමුණා නැඹුරු වූ තැනැත්තවූ කර ඔසවා ගත නොදී ම එක් අතෙකින් **පිටිකර** හා එක් අතෙකින් **පිටිමුල** හා තරයේ අල්ලාගෙන..........

(අ) මෙම පාඨය හා සම්බන්ධ සිද්ධිය කෙටියෙන් ලියන්න.

(ආ) අංකිත පදවලට අර්ථ සපයන්න.

iii. සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින **පිල්බර ගණ** ගොදුරට
**වෙසෙස් රුචින්** තම මැවුවත් බඹහට
සඳැස් සවන් නොකළැ' යි වූ නොසතුට

(අ) වීණා නාදය වඩාත් හොඳින් ශ්‍රවණයට මෙහි සිටින්නන්ට බාධා වූයේ කුමක් ද?

(ආ) අංකිත පදවලට අර්ථ සපයන්න.

REFERENCE
ONLY

iv. නිරතදිග තද සුළඟට ඇඹරවී ඇටුවන් බැහී ගිය ගහක් මෙන් ඇගේ. ශරීරය ද නැමී ඇඹරී තිබිණ. මුහුණෙන් සිහින්ව ගිය අත් පා වලත් සම ගසක පොත්තක් මෙන් ගොරහැඩි ව රැලි වැටී ඇටයට ඇලී ගියේය.

(අ) 'ඇය' කෙබඳු අයෙකු ද? යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
(ආ) මෙහි සඳහන් වන උපමාවක් හා උපමේයක් උපුටා දක්වන්න.

v. රුති වනපෙති නැවිදින් සුමුවෝයා
නිති මියුරැති වෙණ නද ළමුයෝයා
සිතිවිලි නැති රූ විලස මුවෝයා
තැති නොගනිති මිනිසුන් සමුවෝයා

(අ) මෙම පද්‍යයෙන් විස්තර වන්නන් කවර දුඩි ආශාවකින් සිටියි ද?
(ආ) මෙහි ඇතුළත් අලංකාරයක් ලියන්න. (ලකුණු 4 x 5 = 20 යි.)

03. පුද්ගල චරිතාභ්‍යන්තරය මතු කරමින් ජාතක කතාකරුවා අපූරු චරිත නිරූපණයක යෙදෙන්නෙකි.
i. සතර කන් මන්ත්‍රණය
ii. ධර්ම යුද්ධය යන කොටස් දෙක ඇසුරින් උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.
(ලකුණු 15 යි.)

නැතහොත්
"බැද්දේගම" කතා පුවතට උපයුක්ත වූ
i. අවස්ථා නිරූපණ හා
ii. භාෂා ලක්ෂණවල විශේෂතා උදාහරණ දෙක බැගින් පෙන්වා දෙමින් විමසුමට ලක් කරන්න.
(ලකුණු 15)

04. ජන සංස්කෘතියේ කැඩපත "සිංහල ජන කවියයි" නිර්දිෂ්ට ජනකවි ඇසුරින් (භානා හිය පානා අඬහැරෙන් දුනේ.) උදාහරණ දෙක බැගින් සපයමින්, පහත අවස්ථා විමසන්න.
i. කාව්‍යාලංකාර භාවිතය
ii. උපදේශයන් සැපයීම. (ලකුණු 15)

නැතහොත්
i. ගුත්තිල කවියා, මතු කළ අර්ථ රසය හා ශබ්ද රසය,
ii. සරල භාෂා ලක්ෂණ,
එක් කරුණක ට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.
(ලකුණු 15)

- 5,6,7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.

05. 'බලය' ලබා ගැනීම සඳහා කේවට්ට බමුණා යොදා ගන්නා අසාර්ථක උපක්‍රම උදාහරණ තුනක් දෙමින් විමසන්න. (ලකුණු 10)

06. "ගුත්තිල කවියා අවස්ථා නිරූපණ ය තුළින් චිත්තරූප මවන්නෙකි." උදාහරණ තුනක් දෙමින් විමසන්න. (ලකුණු 10)

07. චරිත නිරූපණයේ දී කතුවරයාගේ ප්‍රතිභාව මනාව සනාථ වන ආකාරය 'බැද්දේගම' නවකථාව ඇසුරින් උදාහරණ තුනක් දෙමින් විමසන්න. (ලකුණු 10)